# බෞද්ධ සන්නිවේදනය හැඳින්වීම

**ආචාර්ය ඒ එම් එන් වසන්ත මෙන්ඩිස්**

සන්නිවේදන ක්‍රියාවලියෙහි මුඛ්‍යාංගයක් ලෙස ග්‍රාහක ස්ථානය සැළකේ. සන්නිවේදකයා මෙන් ම ග්‍රාහකයා සතුව ද ශිල්පීය දක්ෂතා ආකල්ප සමන්විත වේ. සන්නිවේදන විෂය කෙරෙහි සන්නිවේදක මෙන් ම ග්‍රාහක ඥානය හා ආකල්පය සමව පවතී නම් එහි දී වඩා සාර්ථක කාර්යයක් ඉටු වනු ලැබේ. මේ පිළිබඳ දැඩි අවධානයකින් යුක්තව සිය ධර්ම සන්නිවේදනය සිදු කළ සන්නිවේදකයෙක් ලෙස බුදුරජාණන් වහන්සේ හඳුන්වා දීම යුක්ති සහගත වේ. උන්වහන්සේ පෞරාණික ධර්මයේ අවිචාරවත් බවින් එල්බ සිටීම වෙනුවට විචාරශීලී අනුගාමිකයන් ලෙස ක්‍රියා කිරීමට කටයුතු කරන ලෙස සිය ධර්ම සන්නිවේදනයේ දී අනුබල දීමක් සිදු කරන ලදි.

## 2.1 බෞද්ධ සන්නිවේදනයේ සුවිශේෂතා

මානව ඉතිහාසයේ පහළ වූ අසමසම දේශකයාණන් වන බුදුරජාණන් වහන්සේ සිය දේශනා රටාව ප්‍රමිතිකරණයෙන් යුතුව සකස් කර ඇති බව සමස්ත දේශනාවන් හරහා ම සපථ වන්නකි. එහි දී අවස්ථාවෝචිතව උන්වහන්සේගේ දේශනා ශෛලිය වෙනස් කිරීමක් දක්නට වේ. කළ යුතු ධර්ම දේශනාව බුදුන් වහන්සේ තීරණය කරනු ලැබුවේ ශ්‍රාවකයා හමුව ඔහුගේ යෝග්‍යතාවයන් පිරික්සීමෙන් අනතුරුව වේ. එහි දී සැළකූ යෝග්‍යතාවයන් ලෙස,

- කායික යෝග්‍යතාවය
- මානසික යෝග්‍යතාවය

වැදගත් වේ. මෙහි දී යෝග්‍යතාවය පිළිබඳ පරික්ෂාව **කෙටි පිළිසඳර ක්‍රමය** හා **පරචිත්ත විජාණන ඥාණය** තුළින් සිදු කර ඇත. බුදුන් වහන්සේගේ අභිමුවට ශ්‍රාවකයෙකු පැමිණීමේ දී එම පුද්ගලයා සමඟ සුහදව අදහස් හුවමාරු කරගැනීම සිරිත විය. එහි දී ඇතැම් විට කොසොල් රජු, බිම්බිසාර රජු වැනි පිරිස් ඉතාමත් කුලුපඟව බුදුන් වහන්සේ හා සමඟ දොඩමලු වූ අවස්ථාවන් වේ. එය යහපත් සන්නිවේදකයෙකු සතු ගුණාංගයන් ලෙස ද අගය කළ හැකි වේ. ග්‍රාහක මට්ටම හඳුනා ගැනීමට එය බෙහෙවින් ඉවහල් වන්නකි.

විශේෂයෙන් ම ධර්මය ශ්‍රවණයට තරම් උචිත අයුරින් කායික යෝග්‍යතාවයක් සිය ශ්‍රාවකයා තුළ නොවේ යැයි වටහාගත්තේ වී නම් උන්වහන්සේ එම දුර්වලතා පූරණයට පවා කටයුතු කර තිබේ. වරක් කුසගින්නේ පැමිණි ගොවියෙකු හට ආහාර ලබා දීමෙන් අනතුරුව ධර්ම දේශනය සිදු කළ බවට සාධක වේ. කුසගිනිව සිටින අයෙකුට එය නිවා දමා ධර්මය දේශනය එම කරුණු ඔහුට ධාරණයට බෙහෙවින් ශක්තිය ලැබෙන්නකි. එලෙසම අතීතයේ කළ පාපයක විපාක ලෙස කුණු වූ

ගතින් කිසිවෙකුගේ සරණක් නොමැතිව සිටි පූතිගත්තතිස්ස තෙරුන්ව උණු පැනින් නහවා සිවුරු සෝදා කායික යෝග්‍යතාවය සකසා දහම් දෙසීම තවත් අවස්ථාවකි.[1] පුද්ගලයාගේ කායික හා මානසික පූර්ව සූදානම පිළිබඳව නිරීක්ෂණයකින් අනතුරුව බුදුන් වහන්සේ ධර්මය දේශනා කළ බව **"කච්චි තෙ කමනියං කච්චි යාපනීයං, කච්චි තෙ බාල්හා දුක්ඛා වේදනා"**[2] ලෙස සුවදුක් විචාරීමෙන් පසු දහම් දෙසීම මගින් පැහැදිලි වන්නකි.

කායිකව පමණක් නොව මානසික වශයෙන් ද පූර්ණත්වයක් ශ්‍රාවකයා සතුවීම සන්නිවේදනය සඵලවීමට බලපානු ලබන්නකි. ඒ පිළිබඳ බුදුන් වහන්සේගේ අවධානය යොමු වී ඇති බව පැහැදිලි වන්නකි. එයට නිදර්ශන බුදුන් වහන්සේ සිය ධර්ම දේශනා කිරීමේ දී පුද්ගල චරිත සැකැස්ම පිළිබඳ අවධාරණය යොමු කර ඇති ආකාරයෙන් අවබෝධ වන්නකි. එම චරිත සැකැස්ම වනුයේ,

- රාග චරිත
- ද්වේෂ චරිත
- මෝහ චරිත
- ශ්‍රද්ධා චරිත
- බුද්ධි චරිත
- විතක්ක චරිත

එම පුද්ගල චරිතවලට උචිත දේශනාවන් තීරණයට තරම් උසස් වූ ඥාණයක් බුදුන් වහන්සේ සතු විය. විනේය ජනයා හික්මවනු වස් දහම් දෙසීම චරිතයට උචිතවන ආකාරයට භාවනා ශිල්ප ක්‍රම උන්වහන්සේ විසින් භාවිත කරන ලදි. එය සුවිශේෂි සන්නිවේදකයෙකුගේ ගුණාංග අවධාරණය කරනු ලබන්නකි.[3]ඒ අනුව බුදුන් වහන්සේ මානසික යෝග්‍යතාවය මත අනුගමනය කළ දේශනා විධි දෙකකි.

- අනුපුබ්බිකතා
- සාමොක්කංසිකා

අනුපුබ්බිකතා ක්‍රමය යනු, සරල තැන සිට ක්‍රමිකව ගැඹුරු දහම් කරුණු වෙත යොමු වීම වේ. ඍජුව ගැඹුරු දහම් දේශනයන් සිදු නො කර එහි දී සරල බසින් ධර්මය දේශනා කරන ලදි. බුද්ධි මට්ටමින් අඩු ශ්‍රාවකයින්ට ම එය වඩා උචිත විය.**(මෙයට උදාහරණ දෙන්න)** ධර්ම දේශනා කිරීමේ දී අනුපිළිවෙළින් දහම් දෙසන ක්‍රමය මෙය වේ. සාමාන්‍ය ගෘහස්ථ පුද්ගලයෙකු හට ඔහුට උචිත වන පරිදි ධර්මය දේශනා කළ බුදුන් වහන්සේ එහි දී දාන කතා, සීල කතා, සග්ග කතා ආදී ලෙසට අන්පිළිවෙළින් ධර්මය දේශනා කරන ලදි. එලෙසම මෙලෙස පිළිවෙළට මෙන් ම මාතෘකාවක් විස්තර කිරීමේ දී පිළිවෙළින් විමසා පර්යාය දක්වමින් (පරියාය දස්සාවි) ලෙසට කටයුතු කරනු ලබයි. **(උදාහරණ දෙන්න)**එහි දී භාවිත වචනය මහා කාරිණික බව පසක් කරවනු ලබන අතර අනවශ්‍ය ආමිස කතාදියෙන් තොරවීමට (නා'මිසන්තර කථං) කටයුතු කරඇති බව පසක් වන්නකි. බුදුන්

[1]

[2]

[3] තීනි කෝසල්ලානි ආය කෝසල්ලං, අපාය කෝසල්ලං, උපාය කෝසල්ලං දී.නි.iii, 2006, පි.220

වහන්සේ සැමවිට ම දැහැමි කතාවක නිරතවීම අගය කරනු ලැබුවේ ඉන් උසස් සන්නිවේදනයකට පසුබිම සකසන නිසාවෙනි. **"නන්දක, දහම් දෙසුම ඉතා අගෙයි ඔබ වැනි සැදැහැයෙන් අනගාරික ජීවිතයට පිවිසි අය රැස් වූ විට කළ යුත්තේ එබඳු දැහැමි කතාවක නිරතවීම හෝ උතුම් නිශ්ශබ්දතාව භජනය කිරීම යි."**[4] ලෙසට ප්‍රකාශිත අවස්ථාව ඊට සාක්ෂ්‍ය සපයනු ලබයි.

ඍජුව ම ගැඹුරු ධර්ම කරුණු වෙත යොමු වීමක් ද උන්වහන්සේ වෙතින් සිදු වූ අතර එය බුද්ධි මට්ටමින් ඉහළ පිරිස් කෙරෙහි වඩා යොදවන ලදි. කුරු රට වැසියන්ට දේශනා කරන ලද රුක්ඛොපම, සාරොපම, මහ නිධාන, සතිපට්ඨාන දේශනාවන්[5] පස්වග තවුසන්ට දේශනා කරන ලද දම්සක් පැවතුම් සූත්‍ර දේශනය[6] නිදසුන් වේ.

## 2.2 බුදුරජාණන් වහන්සේ භාවිත සන්නිවේදන ක්‍රම ශිල්ප

නොයෙක් පළාත්වල විසිරී සිටි සැතපුම් සියගණන් දහස්ගණන් පවා ඈතට අයත් වන ශිෂ්‍ය හා අනුගාමික පිරිස් බුදුන් වහන්සේ සතු විය. උන්වහන්සේ අවවාද, දේශනා, ඉගැන්වීම් හරහා එවන් වූ විශාල පිරිසක් ආමන්ත්‍රණය කරන ලදි. මෙලෙස විශාල පිරිසක් අවනත කරගත් එම කථිකයා, දේශකයා බුදුන් වහන්සේ විය. උන්වහන්සේගේ දේශනා අන්‍ය ආගමික සිත්සතන්වලට ද සැනසුමක් ගෙන දෙන්නට වූයේ කිසිඳු බලපෑමකින් තොරව ය.

### 2.2.1 දේශනා ක්‍රමය

බුදුන් වහන්සේ සිය ඉගැන්වීමේ දී ප්‍රමුඛව භාවිත කළ ක්‍රමය **දේශනා ක්‍රමය** වේ. එහි දී ශිෂ්‍යයා ගුරුවරයාට ඇහුම්කන් දීම සිදු වේ. අධ්‍යාපන විද්‍යාවත්, මනෝ විද්‍යාවත් මනාව දත් බුදුහු ශිෂ්‍ය චරිතයත්, ආකල්පත් විනිවිද දුටුහ. යමෙකු දුටු සැණින් ඔහුගේ චරිතයත්, පූර්ව භාවයත්, අනාගතයත් බුදුහු දුටුවේ "පරචිත්ත විජාණන, පුබ්බේ නිවාසානුස්සති ඥානයෙනි"[7] එයින් තමන් සන්නිවේදනය කරනු ලබන කරුණ පිළිබඳ ධාරණයට මෙන් ම එය වටහා ගැනීමේ පරිසරයක ග්‍රාහකයා පවතී දැයි යන කරුණ පිළිබඳ අවබෝධයක් සන්නිවේදකයාට හෙවත් බුදුන් වහන්සේට ලබා ගත හැකි විය.

ධර්ම දේශනයේ දී බුදුන් වහන්සේ යොදා ගන්නා ලද දේශනා ක්‍රම 04ක් පහත පරිදි හඳුනාගත හැකි වේ.

අත්ථජ්ඣාසය - තමන්ගේ අදහසට අනුව දහම් දෙසීම

පරජ්ඣාසය - අනුන්ගේ අදහසට අනුව දහම් දෙසීම

අට්ඨුප්පත්ක - ඉදිරිපත් වූ හේතුවකට දහම් දෙසීම

පුච්ඡාවාසික - අසන ලද ප්‍රශ්නයකට දහම් දෙසීම

[4] අං. නි.iv, 2006, පි.358
[5] දී.නි.ii, 2006, පි.436-533
[6] සං.නි. පඤ්චම භාගය, 2006, පි.270-275
[7] සරණංකර නා හිමි, ගණේගම, බුදුහාමුදුරුවෝ, 1989, පි.15

ප්‍රශ්න ඇසීමෙන්, ශිෂ්‍යා අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් යම්කිසි සිද්ධියක් මුල් කොටගන සාකච්ඡා කිරීමෙන් අවබෝධාත්මකව බුදුන් වහන්සේ ස්වකීය සන්නිවේදනය සිදු කරන ලදි. බුදුන් වහන්සේ ආරාමයෙහි දම්සභා මණ්ඩපය මත වැඩ සිටින අතර එහි දී ධර්ම සාකච්ඡාවල යෙදී සිටින භික්ෂූණ් අමතා බුදුන් වහන්සේ ධර්මය දේශනා කරන ලදි. එහි දී බුදුන් වහන්සේ වැඩමවීමට පෙර සාකච්ඡා කරන ලද මාතෘකාව විචාරා **"කායනුත්ථ භික්ඛවේ එතරහි කථාය සන්නි සින්නාති"** ලෙස අසන කළ නිශ්ශබ්දව සිටින භික්ෂු සමූහය අතුරින් එක් භික්ෂුවක නැඟිට අප විසින් රාජ කතා, චෝර කතා ආදී දෙතිස් කතාවල නොයෙදෙමු. අප විසින් අසවල් සිද්ධිය, අසවල් භික්ෂුව පිළිබඳ කතා කළෙමු ලෙසට පිළිතුරු දෙනු ලැබි ය. එහි දී ඊට අදාළ වන විස්තරය බුදුන් වහන්සේ ඉදිරිපත් කරනු ලැබී ය.[8]

බුදුන් වහන්සේ විසින් වරෙක තම සිතැඟි පරිදි ධර්මය දේශනා කළ අවස්ථාවන් වේ. දේශන සැලැස්මකට අනුව සිදු වන එහි දී බුදුන් වහන්සේ ශ්‍රාවකයාට කරුණු පැහැදිලි කිරිමක් සිදු කරනු ලබයි. විවිධ ආරාමයන්හි, ස්ථානයන්හි දී සිදුකරන ලද එම දේශන රාශියක් සූත්‍ර පිටකය තුළ දක්නට වේ. ජේතවනාරාමය, වේළුවනාරාමය අදී වූ ස්ථාන ඊට නිදර්ශන වේ. සැවැත්නුවර සමීපයේ අනේපිඬු සිටු විසින් කරවන ලද ආරාමයෙහි වැඩ හිඳිමින් බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයින් අමතා කළ දේශනාවන් වේ. සූත්‍රයන්හි සමාරම්භයෙහි ඒවා පිළිබඳ දක්නට ලැබෙනු ඇත. **"මහණෙනි"**යි ලෙසට භික්ෂූන් ඇමතු කළ **"වහන්ස"** ලෙස බුදුන්ට පිළිතුරු ලබා දීමක් එහි දී දැකගත හැකි වේ.[9]

නමුත් ඇතැම් විට දේශකයාගේ අදහස අනුව පවසන යමක් අසා සිටීම නීරස යැයි හැඟුණත් බුදුන් වහන්සේගේ ක්‍රියාකලාපයෙන් එසේ සිදු නො වීය. වරෙක ශ්‍රාකයාට කුතුහලය උපදවාලීමට ද එම දේශනය සමත් විය. සතිපට්ඨාන සූත්‍රය[10] එයට නිදර්ශන වේ. සත්ත්වයන්ගේ පාරිශුද්ධත්වයට, සෝක පරිදේවයන් ඉක්මවීමට, දුක්දොම්නස් නැතිකිරීමට, ආර්ය මාර්ගයට පැමිණීමට, නිවන් අවබෝධයට හේතුවන එක් මාර්ගයක් ඇති බව මෙමඟින් දේශනා කරන ලදි. වරෙක මිහිරිවත් කුතුහලය උපදවමිනුත් සිදු කරනු ලබන එම දේශනා ශ්‍රාවක සිත් සතන් යථාවබෝධයට පත් කරවීමට තරම් සමත් වන්නකි.

අන්‍යයන් උදෙසා ඔවුන් තුළින් මතු වූ හේතුවකට දහම් දෙසීමක් මෙහි දී දැක ගත හැකි වේ. වරක් **සභිය** නම් පිරිවැජියා තමන්ට ඇති වූ ප්‍රශ්නයක් විසඳා ගැනීමට විවිධ ගුරුවරුන් හමුවට ගියත් එයින් ඵලක් නො වූ නිසාවෙන් බුදුන් වහන්සේ වෙත පැමිණෙන ලදි. බෙහෝ දුරු කතර ගෙවාගෙන පැමිණි ඔහුට අනෙක් ගුරුවරුන් මෙන් ද්වේෂයෙන් බැන නො වැදී මහා කාරුණිකව ධර්මය දේශනා කළ බුදුන් වහන්සේ සභිය හට ඕනෑම පශ්නයක් අසා දැන ගැනීමට අවස්ථාව ලබා දෙන ලදි. මෙයින් ඔහු තුළ අති වූ ප්‍රීතිය අතිමහත් විය. එනිසාවෙන් **"භවත්නි ඒකාන්තයෙන් අසිරියෙකි. භවත්නි ඒකාන්තයෙන් නොවූ විරුවකි. අනු මහණ බමුණන් වෙත මම ඒකාන්තයෙන් යම් බඳු අවකාශමය මාත්‍රයක් නොලදිම් ද මට ඒ අවසරය ශ්‍රමණ ගෞතමයන්වහන්සේ විසින් දෙන**

8 සරණංකර නා හිමි, ගණේගම, බුදුහාමුදුරුවෝ, 1989, පි.17

9 එක සමයං සාවත්ථියං විහරති ජේතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමේ තත්‍රඛෝ භගවා බික්ඛු ආමන්තෙසි භික්ඛවොති භදන්තෙහි තෙ බික්ඛු භගවතො පච්චසසොසුං භගවා එතදවෝච ම.නි.i, 2006, පි.154-164

10 එකයානො අයං බික්ඛවේ මගො සත්තානං විසුද්ධිවා සෝක පරිදෙවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථංගමාය ඤායසස අධිගමාය නිබ්බානසස සච්ජිකිරියාය එම, පි. 134-154

**ලද්දේ විය."**[11] බුදුන් වහන්සේ විසින් මෙලෙස දිගින් දිගටම සියලු ප්‍රශ්න නිරාකරණය කරමින් දේශනය සිදු කරනු ලැබීමෙන් සිදු වන්නේ එහි දී දෙපාර්ශවයම ක්‍රියකාරී සහභාගීත්වයක් ලැබීම වේ.

සමාජයෙන් හෝ තම ශ්‍රාවකයින් අතර ඇති වූ හේතුවකට අනුව ධර්මය දේශනා කිරීමක් සිදු විය. **සුප්පිය පිරිවැජියා** සම්බන්ධ අවස්ථාව ඊට උදාහරණ සපයයි.[12] ඔහු විසින් බුදුන් වහන්සේට කළ අපහාසය පිළිබඳ භික්ෂූණ් සාකච්ඡා කරමින් සිටින බව දැන ශාලාව කරා එළැඹි බුදුරදුන් එම අවස්ථාවේ දී ධර්මය දේශනා කරන ලද්දේ එම කරුණු මුල් කරගනිමින් වේ.

බුදුන් වහන්සේ විසින් ධර්මය ඉගැන්වීම උදෙසා පිළිතුරු ලබා දුන් ක්‍රම 04ක් ද වේ.

ඒකාංශ ව්‍යාකරණ - ඍජු පිළිතුරු ලබා දිම

විභජ්ජ ව්‍යාකරණ - කොටස් කොට පිළිතුරු දීම

පටිපුච්ඡා ව්‍යාකරණ - ප්‍රතිප්‍රශ්න අසමින් පිළිතුරු දීම

ඨපනීය ව්‍යාකරණ - පිළිතුරු නොදී බැහැර කිරීම

මේවායෙහි භාවිතය අවස්ථාවෝචිතව සිදු වු බව බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රයන් පරිශීලනයේ දී පැහැදිලි වන්නකි.

### 2.2.2 සාකච්ඡා ක්‍රමය

විධිමත් මෙන් ම අවිධිමත් සංවාද හා සාකච්ඡා මිනිසා සමාජ ජීවියෙකු වශයෙන් ගමන් ආරම්භ කළ දා පටන් පැවත එන්නකි. එහි දී දැනුම, තොරතුරු ආදිය සන්නිවේදනයට හැකි විය. ග්‍රීක දාර්ශනිකයින් අතර ද ඉතා ජනප්‍රිය සාකච්ඡා ක්‍රමය ඉන්දීය සමාජයට උචිත නො වුණි. එහි පැවති සමාජ, ආගම් රටාව ඊට බලපා ඇති බව අධ්‍යයනයේ දී පැහැදිලි වන්නකි. එහෙත් ඉගෙනුම් ක්‍රමය සාර්ථකව කිරීමෙහි ලා ඉතා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස සාකච්ඡා ක්‍රමය හැඳින්විය හැකි බව අධ්‍යාපන මනෝවිද්‍යාවේ දී ද පිළිගත් කරුණකි. ඒ තුළින් ශිෂ්‍යයාව සක්‍රියව පාඩමට සහභාගී කර ගත හැකි වීම ඊට හේතුව වේ.

සාකච්ඡාවේ දී ඥානාන්විතව සාකච්ඡා සිදු කළ යුතු අතර එහි දී කෙටි සරල සාකච්ඡාවක් පුද්ගල දැනුම පුළුල් කිරීමට තරම් ප්‍රබල නොවේ. අර්ථ සම්පන්න සාකච්ඡාවක් මංගල කරුණක් වන බව දක්වා බුදු දහම දීර්ඝ කාලීනව පැවැත්වෙන සාකච්ඡා ඥානය පුළුල්වීමට බලපැවැත්වෙන බව පිළිගනු ලබයි. ඥානවන්තයින් විසින් සිදු කරනු ලබන එවැනි සාකච්ඡාවන් නැවත නැවත මෙනෙහි කිරීම කළ යුතු බවත් උන්වහන්සේගේ අදහස වේ.[13]

---

[11] අච්ඡරිය වත හො අබහුතං වත හො යං වතාහං අඤ්ඤසු සමණ බ්‍රාහ්මණෙසු ඔකාස කමම කතනති අතතමනො පමදිතො උදගෙගා පීති සොමනසසජාතො භාගවනතං පඤහං පුච්ඡි සු.නි., 2006, පි.154

[12] අථ බෝ භගවා තෙසං භික්ඛුනං ඉමං සංඛියා ධම්මං විදිත්වා යෙන මණ්ඩල මාළො උපසංකමිත්වා ඉමං පඤ්ඤතෙත ආසනෙ නිසිදි නිසජජ බො භගවා භික්ඛු ආමන්තෙසි කායනත්ථ භික්ඛවේ එතරහි කථාය සන්නිසින්නා සන්නිපතිතා කාච පන බො අනතරා කථා විපපකථාති දී.නි.i, 2006, පි.4

[13] සාකච්ඡාය බො මහාරාජ පචචාවේදිතබෙබා සච බො දීපෙන අද්ධුනා න ඉත්තරං මනසිකාරොනෙතෝ නො අමනසීකාරොනෙතා පඤ්ඤාවනෙතා නො දුපපඤ්ඤා ජටිල සූත්‍රය

ඇතම් විට පුද්ගලයාට වැදගත් නො වන විට දී හෝ පුද්ගල ස්වභාවය අසන ලද පැනයට පිළිතුරු ලබා ගැනීමට තරම් ප්‍රමාණවත් නො වන විට දී උන්වහන්සේ පිළිතුරු දීමෙන් හා සාකච්ඡාවෙන් වෙන් ව සිටි බවට ද අවස්ථා වේ. වරක් උගත්කමින් උඩගුව සිටි **වච්චගොත්ත බමුණා** බුදුන් වහන්සේ වෙත පැමිණ ආත්මය පිළිබඳ විචාල නමුත් උන්වහන්සේ පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන ලදි. ඒ ආත්මවාදී දෘෂ්ටිය බමුණ විසින් බෙහෙවින් අගය කරන නිසාවෙනි. පසුව වච්චගොත්ත බමුණාගේ දුර්වලතාව වටහාගත් බුදුන් ඒ පිළිබඳ බමුණාට පැහැදිලි කරන ලද ආකාරය අග්ගිවච්ඡගොත්ත සූත්‍රය හරහා පැහැදිලි වේ.[14]

**"වච්චගොත්තය, මේ නුඹගේ නො දැනීම යි. මුලාවයි. යම් හෙයකින් මේ හේතුඵල ධර්මය ගැඹුරු ද එහෙයින් ම දැනීමට දුෂ්කර ය. අවබෝධ කළ නො හැක. ශාන්තය, ප්‍රණීතය තර්කයෙන් බැසගත නො හැක. නිපුණය. නුවණැත්තන් විසින් ම දැගත යුතු ය. ඒ බඳු වූ දහම අන්‍ය දෘෂ්ටි වූ අන්‍ය මතික වූ, අන්‍ය රුචික වූ අන් දහමක යෙදීම් ඇති, අන්‍ය ආචාර්ය කෙරෙහි බැඳුණු නුඹ විසින් නො දැන නැත. එහෙයින් වච්චය මෙහි ලා නුඹ විමසිමි. යම් සේ නුඹට වැටහේනම් එය ප්‍රකාශ කරව"**

බුදුන් වහන්සේගේ සාකච්ඡා ක්‍රමය මතුවන තවත් අවස්ථාවක් **කේසි** නම් අශ්ව දමනය කරන්නා අතර පැවති සංවාදය සඳහන් වන කේසි සූත්‍රයෙන් පැහැදිලි වේ. එහි දී බුදුන් වහන්සේ කේසිගෙන් අසනුයේ නාඹර අශ්වයෙකු දමනය කිරීමේ ක්‍රම වේ ද ඒ කවරේ දැයි කියා ය. එවිට මෘදු බවින් හෝ රළු බවින් හෝ දෙවිධියම යොදා එය සිදු කරන බව ඔහුගේ අදහස විය. එහෙත් බුදුන් විමසනුයේ එසේ කිසිම අයුරකින් දමනය කළ නො හැකි නාඹර අශ්වයෙකු වුවහොත් කුමක් කරන්නේ දැයි ලෙසට ය. එවිට එම සත්ත්වයා මරා දමන බවට පැවසීය. අනතුරුව කේසි බුදුන්ගෙන් අසනුයේ ධම්මසාරථි වන ඔබ කෙලෙස පුරුෂයන් දමනය කරන්නේ දැයි ලෙසට වේ. තමන් ද එසේ මෘදුව හෝ රළුව පුරුෂයන් දමනය කරන බවත් කාය වාග් මනෝ සංවරයෙන් වන ප්‍රතිඵල දේශනා කරන බවත් පැවසී ය. මා විසින් කාය වාග් මනෝ දුෂ්චරිතයේ විපාක දේශනා කරමින් රළුව සංවර කරන බව පැවසූ බුදුන් වහන්සේ මෙම දෙකොටසෙහිම යහපත් හා අයහපත් ප්‍රතිඵල ප්‍රකාශ කිරීම මෘදු හා රළු ක්‍රමය වන බවට පැහැදිලි කරන ලදි.

අනතුරුව කේසි විමසනු ලැබුවේ එම දෙආකාරයෙන් ම හික්මවිය නො හැකි පුරුෂයින් දමනය කරනුයේ කෙලෙස ද ලෙසට ය. එවිට බුදුන් පවසනු ලැබුවේ ඔහුව නසා දමන බව යි. ඉන් පුදුමයට පත් කේසි හට බුදුරදුන් පැහැදිලි කරනු ලැබුවේ එවන් නො හික්මුණු පුරුෂයන් හට අනුශාසනා කිරීමෙන් වැළකී සිටීම නසා දැමීමක් වන බව වේ.[15] කුමන පදනමක් මත කවර පුද්ගලයින් සමඟ සාකච්ඡා පවත්වන්නේ දැයි යන්න පිළිබඳ බුදුන් වහන්සේ සතුව අවබෝධයක් වූ බව මෙයින් පැහැදිලි වන බව සඳහන් කළ හැකි ය. එලෙසම උන්වහන්සේ යමෙකු හා සාකච්ඡාවක් පවත්වයි ද එය අර්ථාන්විතව පුද්ගලයා යහමඟට යොමු කරනු වස් උපකාර වන්නක් බවට ද පැහැදිලි වන්නකි. එය සාර්ථක ආචාර්යවරයෙකුගේ ද ලක්ෂණයක් වේ.

---

[14] ම.නි.ii, 2006, පි.262

[15] වධො හෙස කෙසී, අරියසස විනයෙ යං න තථාගතො වතබබං අනුසාසිතබබං මඤ්ඤති. නපි විඤ්ඤු සබ්5මචාරී වකතබබං අනුසාරිතබබං මඤ්ඤතීති අං.ii, 1956, පි.220

බුදුන් වහන්සේ අන්‍ය ආගමිකයින්ට පවා සිය දේශනාවන් පැවත්වූ අවස්ථා බෞද්ධ සාහිත්‍යය තුළ සඳහන් වේ. විවේකී අවස්ථාවන්වල අන්‍ය ආගමික ආරාමවලට වඩින බුදුරදුන් සමයාන්තර ඉගැන්වීම් පිළිබඳ විවෘත සාකච්ඡා පැවැත්වීම සිදු කරන ලද්දේ ඔවුන් සිය ආගම වෙත නැඹුරු කරගැනීමට නොව සත්‍යය වටහා දීමට පමණි.[16] එම ස්ථානයන්හි උන්වහන්සේ දේශනා කරන ලද දේශනාවන් ඔවුන්ට ඉතා ප්‍රයෝජනවත් වූ බව ඔවුන් විසින් ම පිළිගන්නා ලදි. **සුසීම** වැනි පරිබ්‍රාජක ගුරුවරු සිය ශිෂ්‍යයන්ට ඉගැන්වීම උදෙසා බුදුන් වහන්සේගේ ඇතැම් දේශනාවන් ඉගෙන එය සිය දර්ශනයේ පෝෂණය උදෙසා තබාගැනීමට කටයුතු කළ අවස්ථා වේ. **භග්ගවගොත්තගේ** ආරාමය ද බුදුන් වහන්සේගේ පහස ලද ස්ථානයක් විය.[17]

බුදුන් වහන්සේ හා අජාසත් රජුන් අතර පැවති සංවාදය ද ඉතා වැදගත් වූවකි. පවිටු මිතුරු ඇසුර නිසාවෙන් පීතෘඝාතන සොවින් සිටි අජාසත් රජු බුදුන් වහන්සේගේ හමුවට පැමිණීමෙන් පසු එහි වූ ආරාමයේ පරිසර සුන්දරත්වයත්, ආරාමික නිශ්ශබ්දතාවයත්, ශාන්ත පැවැත්මත් නිසා ප්‍රසාදයට පත් වූ අජාසත් රජු බුදුන් වහන්සේගෙන් ප්‍රශ්න අසන්නට විය. ශ්‍රමණ ජීවිතයේ සාන්දෘෂ්ටික විපාක ඇගයීමෙන් ඇරඹි සාකච්ඡාව ඉතා දීර්ඝ විය. මෙබඳු සංවාදය මේ තාක් හමු වූ ආචාර්යවරුන් හා කළ සංවාදයන්ට වඩා වෙනස් බවත් ශ්‍රාවකයා මුළා කිරීමට නොව යථාවබෝධය උදෙසා උපකාර වන්නක් බවත් අජාසත්තගේ අදහස විය. අනෙක් ආගමික ආචාර්යවරුන් අසන ලද ප්‍රශ්නයකට සෘජුව පිළිතුරු නොදී ශිෂ්‍ය මුලා කිරීම් උපක්‍රමශීලී වන බව රජුගේ මතය විය.[18] ප්‍රථමව ඉතා සරලව ආරම්භ වන සාකච්ඡාව දීර්ඝ වනුයේ ඉතා ගැඹුරු කරුණු ඉදිරිපත් කිරීමකිනි. අනෙක් ආචාර්යවරුන්ගේ ක්‍රියා කලාපයෙන් උරණ නො වූ අජාසත් රජුගේ නිහතමානී ක්‍රියාව හේතුවෙන් අවසානයේ බුදු පහස ලැබීමට තරම් අජාසත් රජු වාසනාවන්ත විය. පීතෘ ඝාතක පව නොවේ නම් අජාසත්තයන් හට බුදුන් හා කළ සාකච්ඡාවෙන් පසු මාර්ගඵල ලැබීමට තරම් හේතු වේ යැයි බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයින්ට වදාරණ ලදි. **සාමඤ්ඤඵල සූත්‍රයේ** දී චූලසීහ, මධ්‍යම සීල හා මහා ශීල ලෙස බෙදා වෙන්කර ඇත්තේ මෙම අනුපූර්ව ක්‍රමය විශේෂණ කොට දැක්වීමට බවට සිතිය හැකි ය. මෙම සාකච්ඡාව තුළින් බුදුන් වහන්සේගේ සන්නිවේදන හැකියාව මෙන් ම ආචාර්යවරයෙකු සතුවන යහපත් ගුණාංග උන්වහන්සේ සතු බව තීව්‍ර වන්නකි.

සාකච්ඡාවට සහභාගී වන පුද්ගලයා ඒ කරුණ පිළිබඳ මනා අවබෝධයකින් පසුවේ නම් එය වඩා පහසු වන්නකි. එලෙසම තම මතයෙහි ම සිටීමත්, පරිකල්පනයෙන් යුතුව සිටීමත් යහපත් සාකච්ඡාවකට එක්වන පුද්ගලයෙකුගේ ලක්ෂණයක් වේ. ප්‍රශ්නය කරන කළ වෙනත් ප්‍රශ්නයක් යොමු කරමින් ප්‍රශ්න මඟ හරින්නා සාකච්ඡාවට නුසුදුසු වන්නා සේම අදාළ ප්‍රස්තෘතයට අන්‍ය සාකච්ඡා කරන කෝපය, ද්වේෂය ආදී හැඟීම් මෙන්ම සිය අසතුට පළ නො කරන පුද්ගලයා ද සාකච්ජාවට උචිත වන්නෙක් බව බුදුන්ගේ අදහස වේ.[19]

---

[16] විජේබණ්ඩාර, චන්දිම, මොරටුවගම, එච්.එම්., බෞද්ධ ශිෂ්ටාචාරයඃමූලධර්ම සහ වංශකථාව, 1990, පි.52

[17] දී.නි. iii, පාටික සුත්ත, 2006, පි.2-58

[18] සොයථාපි භනෙත අම්බංවා පුටෙඨා ලබුජංවා බ්‍යාකරෙය්‍ය ලබුජං වා පුටෙඨා අමබං බ්‍යාකරෙය්‍ය දී.නි.ii, 2006, පි.102

[19] තථාසමපයෝගෙන භික්ඛවේ පුගගලා වේදිතබෙබා යදිවා කචෙඡා යදි වා අකචෙඡාති. පඤ්හං පුටෙඨා සමානො ඨාන ඨානෙ සණ්ඨාති, පරිකපේ‍ය සණඨාති අඤ්ඤවාදෙන සණඨාති. පටිපදාය සණඨාති, එවං සනතාය භික්ඛවේ පුගගලො කචෙඡා හොති අං.නි.i, තික නිපාතය, 2006, පි.352

මේ අනුව යහපත් සන්නිවේදනයක දි සාකච්ඡා ක්‍රමයේ පැවැත්මට අවශ්‍ය වන්නා වූ පුද්ගලයන් අතර පැවතිය යුතු ලක්ෂණ මෙහි දී අනාවරණය වේ. බුද්ධ ශ්‍රාවකයෙකු සිය ධර්ම සන්නිවේදනයේ දී සාකච්ඡා ක්‍රමය අනුගමනය කළ බවට ත්‍රිපිටකය සාක්ෂ්‍ය සපයනු ලබයි. භික්ෂුණීන්ට අවවාද අනුශාසනා කිරීමට භික්ෂූණ්ට එදවස පැවරී තිබුණු අතර එහි දී **නන්දන තෙරණුවෝ** තම වාරය ප්‍රතික්ෂේප කරන්නේ විය. එහෙත් බුදුන් නියමයෙන් නන්දක තෙරණුවෝ දිනක් මෙහෙණවරට වඩින ලදි. සංවේදී සාකච්ඡා ප්‍රවේශයක් ගත් උන්වහන්සේ භික්ෂුණීන් අමතා භික්ෂුණීන්ට හට පවසන කරුණ වැටහේ නම් වැටහේ යැයි ද නො වැටහුණේ නම් නො වැටහෙන බව ද සැකයක් හෝ විමතියක් වේ නම් ඒ පිළිබඳ අසා පැහැදිලි කරගත යුතු බව දක්වන ලදි.[20] මේ අනුව පැහැදිලි වනුයේ චින්තනය ඇගයීමක් සිදු කොට ඇති බව ය. බුදුරදුන් ද නිරන්තරව පුද්ගල සිතීමේ හැකියාව උසස් කොට සළකන ලදි. එය ශ්‍රාවකයන් කෙරෙහි ද බලපැවැත්වුණු බවත් එනිසාවෙන් යහපත් සන්නිවේදනයක් ඉන් සිදු වූ බවත් පැහැදිලි වන්නකි.[21] එය සාර්ථක ප්‍රවේශයක් නිසාවෙන් බුදුන් වහන්සේගේ ධර්හුමියෙහි සීඝ්‍ර ව්‍යාප්තියට ද එය ඉවහල් වූ බව නො රහසකි.

### 2.2.3 ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය

සන්නිවේදන උපාය මාර්ග භාවිතය පිළිබඳ විමසන කළ බුදුරජාණන් වහන්සේ විසින් ග්‍රාහක රුචි අරුචිකම් අනුව සිය කාර්යය ඉටු කළ බව නිරන්තරව ප්‍රත්‍යක්ෂ වන්නකි. අවස්ථාවෝචිතව ශිල්පීය ක්‍රමයන්ට අනුව උන්වහන්සේ කටයුතු කළ ආකාරය හරහා මනා සන්නිවේදන කාර්යයක් ඉටු කර ගැනීමට හැකි වූ අතර ශ්‍රාවක ප්‍රසාදය මෙන් ම ශ්‍රාවකයාට පූර්ණ අවබෝධයක ද ඉන් ලබා ගැනීමට හැකි වූහ. එය ආදර්ශවත් ගුරුවරයෙකුගේ ලක්ෂණයක් ද වේ. බුදුරජාණන් වහන්සේ යමක් කවරෙකුට හෝ අවබෝධ කරලීමේ දී එය පූර්ණ අවබෝධයක් ලෙස ලබා දීමට කටයුතු කරන ලදි. ශිෂ්‍ය ආකර්ෂණය මැනවින් ලබා ගනු සඳහා දෘශ්‍යාධාරක යොදා ගනිමින් නිර්මානාත්මකව හා ස්ථානෝචිතව කටයුතු කිරීමක් බෞද්ධ සන්නිවේදකයන් හරහා දැකගත හැකි වේ.

රූපය භාෂාව කොට ගත් දෘශ්‍ය මාධ්‍ය ක්‍රමය තුළින් විවිධ රූප ගොනු කරගනිමින් පණිවිඩ හුවමාරු කරනු ලබයි. රූප ඥානය සතුවීම එනිසාවෙන් දෘශ්‍ය මාධ්‍යකරුවා සතුවිය යුතු අත්‍යවශ්‍ය සාධකයක් වේ. එක්තරා විශේෂ වූ අදහසක් අපූර්ව නිර්මානකරණයෙන් යුතුව ප්‍රබලව ඉස්මතු කරමින් ග්‍රාහකයා වෙත යොමු කිරීමට ඔහුට හැකි විය යුතු ය. එහි දී එම පණිවුඩයේ සාර්ථකත්වය උදෙසා සන්නිවේදකයා විසින් සැළකිළිමත් විය යුතු කරුණු කිහිපයකි. එළිය අඳුර ගැළපීම, වර්ණ සංකලනය, පර්යාවලෝකනය සහ ත්‍රිමාණ ස්වරූපය මතු කර ගැනීම වැනි තාක්ෂණ විධීන්[22] ඒවා වේ. චිත්‍ර මාධයක දි පරිකල්පන හැකියාව මෙන් ම පුහුණුව ද අවශ්‍ය වන අතර වර්ණ සංයෝගය ද ඒ සඳහා අවැසි වේ. ඡායාරූප ශිල්පයේ දී තාක්ෂණික හැකියාව ද අවශ්‍ය වන්නකි. ගායන ශිල්පීන් වාදන ශිල්පීන් සිනමාකරුවන් අංග රචකයින් ආදීන් විසින් සන්නිවේදනය සිදු කිරීමේ දී මෙය මාධ්‍ය කොටගන්නා අතර ඇතැම්විට පූර්ණ අවබෝධයක් ඒ පිළිබඳ ව නොමැති වුවත් සිය කාර්යය පූරණයට අවශ්‍ය දැනුමක් ඔවුන් සතුවිය යුතු වේ. කළමනාකරණය සහ මෙහෙයවීම ආදී වූ ගුණාංග

---

[20] පටිපුච්ඡ කථා බො භගිනියො භවිසසති. තඤ්ජ අජානනතීති හි ආජානාමතිසස වචනීයං, න ආජානනතීහි න ආජානාමාතිසස වචනීයං යසස වා පනසස කඞ්ඛාවා විමතීවා අහමේව තඤ්ජ පටිපුච්ඡිතබ්බො ම.නි.iii, 2006, පි.552

[21] පරමානන්ද හිමි, පොල්ගස්වත්තේ., බුදුරජාණන් වහන්සේ ලොව අසිරිමත් ගුරුවරයා, 2005, පි.63

[22] ඩයස් මාකස්, සිඩ්නි., සන්නිවේදන සහ මාධ්‍ය අධ්‍යනය, 2012, පි.73-74

ද මෙහි සඵලත්වයට බලපානු ලබන්නකි. නූතනයේ දී බොහෝවිට මෙම දෘශ්‍ය මාධ්‍ය ක්‍රමයේ භාවිතය සුලබවීමක් දැකගත හැකි වේ. ග්‍රාහක අවධානය ඒ කෙරෙහි ප්‍රබල වීම ඊට හේතුව වන්නට ඇත. සාමාජීය ජීවියෙකු ලෙස ජීවත්වීමේ දී විවිධ දෘශ්‍ය සන්නිවේදනයන් හරහා ලබා දෙන ඍජු හා වක්‍ර තොරතුරු ග්‍රහණයට අපට හැකියාව පැවතිය යුතු වේ.

වරක් භාග්‍යවතුන් වහන්සේ දුරින් වඩිනු දුටු රාහුල හිමියන් පාද දෝවනය උදෙසා දිය සුදානම් කළ අතර පසුව පනවන ලද අසුනෙහි වැඩ සිටිමින් පා දෝවනය කරන ලදි. අනතුරුව එකත්පස්ව සිටි රාහුල හිමියන් අමතා බුදුරජාණන් වහන්සේ බඳුනෙහි වූ ඉතිරි දිය යොදා ගනිමින් කරුණු පැහැදිලි කරන ලදි. එහි දී රාහුල හිමිගෙන් බඳුනෙහි ඉතිරි වූ දිය පෙනේ ද ලෙසට ඇමතූ කළ එසේ යැයි රාහුල හිමි පිළිතුරු දෙන ලදි. එම ඉතිරි වූ දිය සේම යමෙකු දැන දැන මුසා කීමෙහි ලජ්ජාවක් නොවේ ද ඔවුනගේ මහණකම ඉතා අඩු බව දක්වන ලදි. අනතුරුව ඉතිරි දිය ඉවත් කළ බුදුරජාණන් වහන්සේ යමෙකු දැන දැන බොරු පවසයි ද ඔවුනගේ මහණකම එලෙස බැහැර කරන ලද්දේ වෙයි ලෙසට පැහැදිලි කරන ලදි. පසුව එම භාජනය යටිකුරු කළ බුදුන් වහන්සේ යමෙකු දැන දැන බොරු කීමෙහි ලජ්ජා නො වෙන පිරිසෙහි මහණකම එය යටිකුරු කළ බඳුන මෙන් වන බව පැවසූහ. අනතුරුව බුදුරජාණන් වහන්සේ  යමෙකු දැන දැන බොරු කීමෙහි ලජ්ජා නො වෙන පිරිසෙහි මහණකම මෙම උඩුකුරු කළ බඳුන මෙන් බව පෙන්වා දෙන ලදි. ඒ අනුව ඔවුනගේ මහණකම හිස්වන බව දක්වන ලදි.[23] ග්‍රාහකයාට භෞතික සම්පත් යොදා ගනිමින් ඉතා උපරිම අවබෝධයක් ලබා දීමට පියවරෙන් පියවර මෙහි දී කටයුතු කළ ආකාරය පැහැදිලි වන්නකි.

බුදුරජාණන් වහන්සේ විසින් භෞතික සම්පත් පමණක් නොව මානව සම්පත ද යොදා ගනිමින් දෘශ්‍යාධාර ලෙස ශ්‍රාවකයින්ට ධර්මය වටහාදීමට කටයුතු කළ ආකාරයට නිදර්ශන වේ. දේශනයට වඩා ඔබ්බට යෑමක් ඒ තුළින් සිදුවන නිසාවෙන් කරුණු අවබෝධයට වඩා පහසුවක් ඉන් සිදුවනු ලැබේ. මනෝමය කායයන්ගේ මැවීමෙන් මනා ධර්ම සන්නිවේදනයක් සිදු කළ ආකාරය බොහෝ ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ චරිත හරහා ගම්‍ය වන්නකි.

රුවින් මත්ව රුවට ලොල් වූ බිම්බිසාර රජුගේ අගමෙහෙසිය වූ **ඛේමාවන්** බුදුන්ගේ ඇසුරට නො රිසි විය. මන්ද යත් බුදුන් වහන්සේ රූපයට ලොල්වීමේ ආදීනව වටහා දෙන බැවිනි. බිම්බිසාර රජු ද ඛේමාවන් බුදුන් හමුවට ගෙන යෑමට උත්සාහ කළත් එය ව්‍යර්ථ විය. අනතුරුව වේළුවනාරාමයේ සුන්දරත්වය ගීතයෙන් ගායකයින් ලවා ගායනා කිරීමෙන් අනතුරුව එයින් වසඟයට පත් ඇය සිය පිරිවර ද සමඟින් වේළුවනාරාමය වෙත යන ලදි. එහි දී භික්ෂූණී වහන්සේ පිරිවරා ධර්ම මණ්ඩපයේ වැඩ සිටින බුදුන් වහන්සේ අයගේ නෙත ගැටුණි. පසුව ඇයට දැකගත හැකි වූයේ බුදුන්ට පවන් සලමින් සිටි රන්වන් පැහැති පියුම්වන් මුහුණැති සුරූපි වරඟනකි. මින් පෙර මෙවන් රූපශ්‍රීයෙන් හෙබි කතක් නො දුටු ඇය ඒ දෙස ම බලා සිටින්නට විය. එහෙත් සිදු වූයේ එම සුරූපී කත ක්‍රමයෙන් දිරාවට පත්වීම වේ. විවෘත වූ පුළුල් මුවින් හෙබි වූ ඇය දත් නොමැතිව, සුදු කෙහෙ ඇතිව අපිරිසිදුව හැකිලුණු කන් ඇතිව අප්‍රසන්න ආකාරයට පත් වූයේ

[23] ම.නි.ii, 2006, පි.130

ඛේමා බලාසිටියදීම විය. ඒ අනුව අවසානයේ ඇයට පවන් සැලීම විනා කෙලින් සිටීමට පවා නො හැකි වූයේ වෙයි.[24]

**"තතො ජරාබිතූතා සා විවණ්ණා විත තානනා**

**භිනන දනතා සෙත සිරා සලාල වදනා සුචි**

**සඬබිතත කණ්ණා සෙතකබි ලම්බාසුහපයොධරා**

**වලි විතත සබබඬගි සිරා විතත දෙහින**

**නතඬගා දණඩදුතියා උපපණඩපපණ්ඩුකා කිසා**

**පවෙධමානා පතිතා නිසසසනති මුහුං මුහුං"**

බුදුරදුන් අනිත්‍යතාව පිළිබඳ කෙතෙක් දේශනා කළත් එයට නො රිසි වූ ඛේමාවන්ට එම දේශනයෙන් අවබෝධ කරගත නො හැකි වූ දෙය මෙම මාධ්‍ය භාවිතයෙන් වටහා ගැනීමට හැකි විය. **"ඔබ වහන්සේ විසින් දෘෂ්ටිගත වූ වනයට වැදුණු කාමරාගයෙන් මුළා වූ මම යහපත් වූ උපායෙන් හික්මවන ලද්දේ විනයෙහි ඇලුනේ වෙමි. නුඹ වහනසේ වැනි උතුම් වූමහ සෘෂිවරයන් නොදැකීමෙන් බොහෝ සත්ත්වයෝ සංසාර සාගරයේ දුක් විඳිති."**[25] ලෙසට ඛේමාවන් විසින් කරන ලද ප්‍රකාශයෙන් ඒ පිළිබඳ පැහැදිලි වන්නකි. බුදුන්ගේ ධර්ම සන්නිවේදනයෙන් ඇය ලද පහස ඉහත සඳහන් ප්‍රතිපෝෂණය දක්වන ප්‍රකාශය හරහා පැහැදිලි වන්නකි.

බුදුන් වහන්සේ ජනපද කළණියට යථාවබෝධය ලබා දීමට කටයුතු කළ ආකාරය ද මීට නිදර්හන වේ. රූපයෙන් ඉතා උසස් ලෙස පරිපූර්ණ වූ ඇය සිය මවගේ බස් අසා සසුන් ගත වුවත් ඇයගේ සිත ඊට එකඟ නො වුණි. ඒ අනුව රූපය විෂයෙහි තවදුරටත් ඇලී ගැලී සිටින ඇයට යථාවබෝධය ලබා දීමට උන්වහන්සේ කටයුතු කරන ලදි. දිනක් භාග්‍යවතුන් වහන්සේ විසින් ජනපද කළණිය හමුවේ මනහර ස්ත්‍රී රූපයක් මවන ලදි. ඇය රූපයෙන් ආඪ්‍ය වූ අතර තමන්ටත් වඩා රුවින් හෙබි ඇ දෙස බලා සිටි ජනපද කළණිය අනතුරුව එම කාන්තාව තමන්ගේ ඇකයෙහි හිස තබා නිදාගන්නා ආකාරය දකින ලදි. ඒ වෙලාවෙහි ඉතා දරුණු මකුළුවෙක් එම කාන්තාවගේ නළලට වැටුණි. පසුව එතැන බිබිලක් හටගෙන එය බිඳී සැරව ගැලීමට පටන් ගන්නට විය. එය ඉතා අප්‍රසන්න බව දුටු ජනපද කළණියට එම කාන්තාවගේ ඉදිමුණු නිල්පැහැති සිරුර දැකීමට හැකි විය. ඇය ජනපද කළණියගෙන් තමන්ට පිහිට වන ලෙස සරණ පතන්නට විය. මේ සියල්ල දැකීමෙන් කළකිරීමට පත් වූ ජනපද කළණියට බුදුන් වහන්සේ ශරීරය පිළිබඳ යථාර්ථය පවසන්නට වූයේ ඉන් අනතුරුව වේ. නන්දාවෙනි, ලෙඩවෙන කුණුවන අපිරිසිදු වූ කය ලෙස බලන්න සිත අසුභ වශයෙන් වඩා එකඟ කරගනුව ලෙසට කළ අවවාදයෙන් ඇයට යථාතත්ත්වාවබෝධය ලබා ගැනීමට හැකි විය.[26]

"තදා මහා කාරුණිකො හාතා මේ ලොකනායකො

දිස්වා සංවිගග චිතතං මං ඉමා ගාථා අභාසථ

---

[24] ඛු.නි., අපදාන පාළි ථෙරී අපදාන,ii, 2006, පි.80

[25] දට්ඨී ගහනපකබනතා කාමරාග විමොහිතා තයාසම්මා උපායෙන විනීතා විනයෙ රතා අදසසනෙන විබ්හෙගා තාදිසානං මහෙසනං අනුභොනති මහා දුක්ඛං සතතා සංසාරෙ සාගරෙ ඛු.නි. අපදාන පාළි ථෙරී අපදානii, 2006, පි.84

[26] එම, පි.140-142